රාජාංගනය ප්‍රාදේශීය සභාව
අනුරාධපුර දිස්ත්‍රික්කය

---

01. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුලි 09 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 සැප්තැම්බර් 04 දිනද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය නොකළ මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට රාජාංගනය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය නොකළ මතය සඳහා පදනම

(අ) ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ උසාවි දඩ හා වරෙන්තු ගාස්තු ආදායම රු.3,577,920 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල රු.3,296,906 ක් ලෙස දක්වා තිබුණු බැවින් රු.281,014 ක් අඩුවෙන් දක්වා තිබුණි. | වර්ෂයට අදාල නිවැරදි ආදායම හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළයුතු වේ. | පිළිගනිමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ හා වරෙන්තු ගාස්තු ආදායම රු.2,920,420 ක් වුවද එය මූල්‍ය ප්‍රකාශනවල රු.2,637,086 ක් ලෙස දක්වා තිබුණු රු.283,334 ක් අඩුවෙන් දක්වා තිබුණි. | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු නිවැරදි ආදායම හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළයුතු වේ. | පිළිගනිමි. |
| (iii) | වටිනාකම රු.1,947,000 ක් වූ මෝටර් රථ හා කරත්ත මූල්‍ය ප්‍රකාශනවල කාර්යාල උපකරණ ලෙස දක්වා තිබුණි. | අදාල වර්ගීකරණයක් යටතේ ගිණුම්ගත කිරීමට කටයුතු කළයුතු වේ. | පිළිගනිමි. |

(ආ) නොසැසඳුණු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කර්මාන්ත ණය හිමියන් මූල්‍ය ප්‍රකාශන අනුව රු.18,086,083 ක් වුවත් කර්මාන්ත ණය හිමි ලේඛනය අනුව රු.18,220,350 ක් වූ බැවින් රු.134,267 ක වෙනසක් විය. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළයුතු වේ. | පිළිගනිමි. සමාලෝචිත වර්ෂයේ කර්මාන්ත ණයහිමි උපලේඛනයේ ශේෂයට රු.134,267 ක මුදල එකතු වී නොමැති වීමෙන් මෙම වෙනස ඇති විය. |

(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.2,341,177 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂ 06 ක් වසර 03 ක් ඉක්මවූ කාලයක සිට පැවතුණි. | ලැබිය යුතු ගිණුම් ශේෂ අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | ඉදිරියේදී ගරු ආණ්ඩුකාරතුමාගේ/ විෂයභාර ඇමතිතුමාගේ අනුමැතිය ලබාගෙන කපා හැරීමට කටයුතු කර නිරවුල් කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.1,248,788 ක් වූ ගෙවිය යුතු මුද්දර ගාස්තු වසර 03 ක් ඉක්මවූ කාලයක සිට පැවතුණි. | අදල මුදල් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කිරීමට කටයුතු කළ යුතු වේ. | වසර 03 කට වඩා වැඩි ගෙවිය යුතු මුද්දර ගාස්තු ශේෂය වන රු.1,248,788 ක මුදල දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කිරීම සඳහා තීරණ අංක 186-2019 අනුව තීරණයක් ලබා ගන්නා ලදී. මෙම වර්ෂයේදී සභා අරමුදලට මුදල් ලැබෙන පරිදි කොටසක් ගෙවා නිමකිරීමට සටහන් තබා ගතිමි. |

(ඈ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වටිනාකම රු.249,793,087 ක් වූ ගිණුම් විෂයයන් 06 කට අදාලව පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් නොකෙරුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළයුතු වේ. | පිළිගනිමි |

1.4 අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) උපවගන්තිය | වාර්ෂික කාර්ය සාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළයුතු වේ. | ඉදිරිපත් කර නැත. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහය | | | |
| | රීති 5.11 | සභාව සතු මාර්ගස්ථ මුදල් සහ වෙනත් වටිනා භාණ්ඩ සම්බන්ධයෙන් රක්ෂණ ආවරණයක් ලබාගෙන නොතිබුණි. | ප්‍රාදේශීය සභා රීති ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | පිළිගනිමි. 2020 වර්ෂයේ සිට මාර්ගස්ථ මුදල් රක්ෂණාවරණයක් ලබා ගැනීම සඳහා කටයුතු කරමි. |
| (ඇ) | 2006 නොවැම්බර් 14 දිනැති අංක PL 53/01/07/දරන පළාත් පාලන සහ අමාත්‍යාංශ ප්‍රතිසංස්කරණ චක්‍රලේඛ | | | |
| | අංක 06 හි 2.2 (iii) | අඛණ්ඩව ක්‍රියාත්මක වන මාර්ග නඩත්තු ක්‍රමයක් අනුගමනය කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව මාර්ග නඩත්තු ක්‍රමයක් අනුගමනය කළයුතු වේ. | පිළිගනිමි. ඉදිරියේදී අඛණ්ඩව ක්‍රියාත්මක වන මාර්ග නඩත්තු ක්‍රමයක් අනුගමනය කිරීමට කටයුතු කරමි. |
| | | සභාවට අයත් මාර්ගවල ගෙනයා හැකි උපරිම බර ප්‍රදර්ශනය කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | ඉදිරියේදී කටයුතු කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 වර්ෂයේ දෙසැම්බර් 31දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 1,352,148 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු. 8,296,376 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කල ආදායම්, රැස්කල ආදායම් හා හිග ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 1,070,000 | 1,675,500 | 1,675,500 | - | 2,409,400 | 1,558,592 | 1,558,592 | - |
| කුලී | 7,804,934 | 7,290,355 | 7,288,105 | 123,000 | 3,648,200 | 7,272,191 | 7,190,991 | 120,750 |
| බලපත්‍ර ගාස්තු | 249,100 | 328,700 | 328,700 | 220,425 | 966,100 | 144,480 | 144,480 | 220,425 |
| වෙනත් ආදායම් | 20,851,061 | 21,072,720 | 20,357,443 | 4,966,586 | 26,245,874 | 20,268,346 | 31,831,684 | 4,251,309 |
| එකතුව | 29,975,095 | 30,367,275 | 29,649,748 | 5,310,011 | 33,269,574 | 29,243,609 | 40,725,747 | 4,592,484 |

#### 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (i) වගන්තිය ප්‍රකාරව සභා බල ප්‍රදේශයේ දියුණුකළ ප්‍රදේශ හඳුනාගෙන වරිපනම් බදු අයකිරීමට කටයුතු කර නොතිබුණි. | දියුණුකළ ප්‍රදේශ වලින් වරිපනම් අයකිරීමට කටයුතු කළයුතු වේ. | පිළිගනිමි. වරිපනම් හා බදු පැනවීමට අවශ්‍ය කටයුතු මේ වනවිට ක්‍රියාත්මක වෙමින් පවතී. |

2.2.3 කුලී

----

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයකර ගැනීමට තිබෙන හිඟ කඩකුලී ආදායම රු.123,000 ක් විය. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | පිළිගනිමි. රු.123,000 ක් වන හිඟ හිටි කඩ කුලී මුදලින් රු.107,500 ක මුදලක් මේ වනවිට රැස් කර ඇත. ඉතිරි හිඟ මුදල වන රු.15,500 අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. |

2.2.4 බලපත්‍ර ගාස්තු

----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයකර ගැනීමට තිබෙන හිඟ හිටි බලපත්‍ර ගාස්තු ආදායම් රු.220,425 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාල ආදායම් අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | පිළිගනිමි. අයනොවී පවතින රු.220,425 ක මුදලට අදාල කේවල ශේෂ බලපත්‍ර ලේඛනවල හඳුනා ගත නොහැකි බැවින් ඉදිරියේ දී කපා හැරීම සඳහා කටයුතු කරමින් පවතී. |

2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

----------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගේ සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.2,637,086 ක් හා මුද්දර ගාස්තු රු. 2,329,500 ක් විය. | අදාල හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | පිළිගනිමි. ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු ශේෂයන්ගෙන් 2019 වර්ෂයට අදාලව ලැබිය යුතු උසාවි දඩ ශේෂය මේ වනවිට සම්පූර්ණයෙන්ම ලැබී ඇත. මුද්දර ගාස්තු ශේෂය අය කර ගැනීමට මේ වනවිට කටයුතු කරමින් පවතී. |

03. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

3.1 කාර්ය සාධනය

-----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය ,පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටුකල යුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව වූ නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභා පනතේ 126 වන වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 28 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු නමුත් 2019 දෙසැම්බර් 31දිනට අදාල කාරණා සම්බන්ධව අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | පනතේ අදාල වගන්ති ප්‍රකාරව අතුරු ව්‍යවස්ථා පැනවීමට කටයුතු කළයුතු වේ. | අතුරු ව්‍යවස්ථා 10 ක් පනවා ඇත. ඉතිරි අතුරු ව්‍යවස්ථා ඉදිරියේදී පැනවීමට කටයුතු කරමි. |

(ආ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030 පිළිබඳව දැනුවත් වී තිබුණු අතර ඒ අනුව අරමුණු පිහිටුවාගෙන වැඩසටහන් සකස්කර නොතිබුණි. | තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030 අනුව අරමුණු පිහිටුවා වැඩ සටහන් සකස් කළයුතු වේ. | පිළිගනිමි. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නොගෙවූ විශ්‍රාම වැටුප් රු.188,856 ක් විය. | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කළයුතු වේ. | නොගෙවූ විශ්‍රාම වැටුප් ශේෂය වන රු.188,856 ක ශේෂ ලැයිස්තු ලැබීමෙන් පසු උපලේඛන ඉදිරිපත් කිරීමට සටහන් තබා ගතිමි. |

3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වසර කිහිපයක සිට පැවත එන ස්ථාන මාරු වී ගිය නිලධාරින් 10 ක ගෙන් හා වැඩ තහනම් වු නිලධාරීන් 04 දෙනෙකුගෙන් අයවිය යුතුව තිබෙන ණය රු.613,137 ක් විය. | අදාල ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | ස්ථාන මාරු වී ගිය අයගෙන් මාසිකව ණය අය වෙමින් පවතින අතර අනෙක් අයගේ ශේෂ වසර ගණනාවක සිට පැවත එන බැවින් විෂයභාර අමාත්‍යවරයා හරහා කපා හැරීමක් සිදු කිරීමට සභා අනුමැතියක් ලබාගැනීමට කටයුතු කර ඇත. |

3.4 මතභේදයට තුඩුදෙන කරුණු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට රු.137,171,454 ක් ස්ථාවර වත්කම්වල වටිනාකම සභාව විසින් පත්කර තිබුණු කමිටුවක තක්සේරුව මත රු.321,721,100 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබීම නිසා ස්ථාවර වත්කම්වල වටිනාකම් සියයට 235 කින් වැඩි වී තිබුණි. | දේපළ තක්සේරු කිරීම පිළිබඳ දැනුමක් ඇති නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් පත්කර තක්සේරු කළයුතු වේ. | පිළිගනිමි. තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරු කිරීම ප්‍රමාදවීම නිසා කමිටුවක් පත්කර වත්කම් තක්සේරුව සිදුකර ඇත. |

3.5 වත්කම් කළමනාකරණය

3.5.1 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වන විට සභාව විසින් පරිහරණය කරනු ලබන රු.18,849,179 ක වටිනාකමින් යුතු වාහන 02 ක් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම වාහනවල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. | මෙම වාහන දෙක පවරා ගැනීමට කටයුතු කරමින් පවතී. |

3.5.2 නිශ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | 2016 වර්ෂයේදී සභාව වෙත ලැබුණු රු.2,655,318 වටිනා ෆෝටෝන් වර්ගයේ ට්‍රැක්ටරය වසර කිහිපයක සිට ප්‍රයෝජනයකට නොගෙන තිබුණි. | භාවිතා කළ හැකි මට්ටමේ පවතී නම් අළුත්වැඩියා කර භාවිතයට ගත යුතු වේ. | අමතර කොටස් නොමැතිවීම හේතුවෙන් මෙතෙක් අළුත්වැඩියා කිරීමට නොහැකි විය. 2020 වර්ෂයේ අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට අපේක්ෂිතයි. |
| (ආ) | සභා පරිශ්‍රයේ රඳවා තිබෙන අක්‍රීය තත්ත්වයේ පවතින කැබ්රථය අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | භාවිතයට ගත නොහැකි නම් අපහරණය කළයුතු වේ. | 2020 වර්ෂයේදී අපහරණ කටයුතු කිරීමට අපේක්ෂිතයි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | රු.370,000 ක් වටිනා ට්‍රැක්ටර් ට්‍රේලරය සහ රු.270,000 ක් වූ ජල බවුසරයක් අක්‍රිය තත්ත්වයේ පැවතුණි. | භාවිතයට ගත නොහැකි නම් අපහරණය කළයුතු වේ. | විධිමත් අනුමැතියක් ලබාගෙන 2020 වර්ෂයේදී අපහරණය කිරීමට අපේක්ෂිතයි. |

04. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

---------------------------------------

අභ්‍යන්තර විගණනය

-----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| උතුරු මැද පළාත් පාලන කොමසාරිස්ගේ 2015 මාර්තු 18 දිනැති අංක 2015/04 දරන චක්‍රලේඛයේ 06ඡේදය ප්‍රකාරව සෘජුවම වගකියනු ලබන අභ්‍යන්තර විගණන නිලධාරියෙකු පත්කර වාර්තා ලබාගෙන තිබූ බවට කිසිදු සාක්ෂියක් ඉදිරිපත් නොවුණි. | අභ්‍යන්තර විගණන නිලධාරියෙකු පත්කර වාර්තා ලබාගත යුතු වේ. | පිළිගනිමි. ඉදිරියේදී අභ්‍යන්තර විගණන නිලධාරියෙකු පත්කර වාර්තා ලබාගැනීමට කටයුතු කරමි. |